වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) හත් අඩියේ කවි ගායනා දැකිය හැකි වන්නේ,
a. කොහොඹා කංකාරියේදීය
b. දොවොල් මඩුවේදීය
c. සූනියමේදීය
d. රට යැකුමේදී
e. පහන් මඩුවේදී

02) දිවි දොස් පුවත පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රය කෘති 2ක් වන්නේ,
a. කුවේණි අස්න හා සිහබා අස්න
b. කුවේණි අස්න හා දඹදෙණි අස්න
c. දීප වංශය හා මහා වංශය
d. දීප වංශය සහ රාජාවලිය
e. මහා වංශය සහ රාජාවලිය

03) තෙල්මේ නැටීම සහ මාගල නැටීම නම් විශේෂ නර්තන අංග 2ක් වන්නේ,
a. උඩරට ගම්මඩුවේදීය
b. සබරගමු ගම්මඩුවේදීය
c. සබරගමු පහන් මඩුවේදීය
d. සබරගමු දෙවොල් මඩුදේදීය
e. පහතරට දෙවොල් මඩුවේදීය

04) අනුපිළිවෙලින් උඩරට, පහතරට, සබරගමු, නර්තන සම්ප්‍රදාය වල ශිලපීය දක්ෂතා ඇති ප්‍රවීණ නර්තන ශිල්පීන් ලෙස නම් කළ හැක්කේ,
a. පණිභාරත, චිත්‍රසේන ඩයස් සහ ජී.වී. හීන්තිලමේය
b. පණිභාරත, කේ ඇස් ප්‍රනාන්දු, සහ ජී වී හීන්තිලමේය
c. පණී භාරත, සව්රිස් සිල්වා සහ ඒ ඉඹුල්ගොඩය
d. චිත්‍රසේන ඩයස්, කේ ඇස් ප්‍රනාන්දු, සහ ඒ ඉඹුල්ගොඩය
e. චිත්‍රසේන ඩයස්, සව්රිස් සිල්වා සහ ජේ ඊ සේදරමන්

05) සූනියම් සහ රටයැකුම් යන ශාන්තිකර්ම වලට අයත් නාට්‍යමය නර්තන අංග ලෙස සැලකෙන්නේ,
a. වඩිග පටුන සහ මරා ඉපැද්දීම
b. වඩිග පටුන සහ කපුයක් කංකාරිය
c. නානුමුරය සහ මරා ඉපැද්දීමය
d. කපුයක් කංකාරිය සහ දරු නැළවිල්ල
e.

06) '' අක්කා ඉතින් නාඩන්නේ '' මෙහි,
a. ලඝු 01 ගුරු 06 සැදැස්මත් 14කි
b. ලඝු 01 ගුරු 06 සැදැස්මත් 13කි
c. ලඝු02 ගුරු 06 සැදැස්මත් 13කි
d. ලඝු 02 ගුරු 05 සැදැස්මත් 11කි
e. ලඝු 03 ගුරු 05 සැදැස්මත් 10කි

07) ජිං සඩනක ජිං කුකුනක / ගදින ගතම් දොම් ගදිතම් / ජී කටිතත් තත් කටිතක'' මෙය
a. මාත්‍රා 4+4 තනිතිතය
b. මාත්‍රා 2+4 දෙතිතය
c. මාත්‍රා 2+3 දෙතිතය
d. මාත්‍රා 3+3 තනි තිතය
e. මාත්‍රා 2+2+4 තුන්තිතය

08) ලන්නව් සරානාජ්ව ප්‍රවීණ කරක් ශිල්පීන් ලෙස කටයුතු කරන ලද්දේ,
a. දුරගා ප්‍රසාද් සහ අද්දන් මහරාජය
b. ක්‍රිෂ්ණා අයියර් සහ අච්චන් මහරාජ්ය
c. ක්‍රිෂ්ණ අයියර් සහ සුන්දර ප්‍රසාද්
d. දුර්ග ප්‍රසාද් සහ බ්‍රිර්ජු මහරජ්ය
e. අච්චන් මහරාර් සහ බ්‍රිර්ජු මහාරජ්ය

09) දක්ෂිණ භාරතීය භරත නාට්‍යම් නර්තනයට යොදා ගන්නා සුවිශේෂ තත් භාණ්ඩය වන්නේ,

a. සිතාරය
b. වීණාවය
c. එස්රාජය
d. තාම්පුරාජය
e. සේනාවයි

10) අනුපිළිවෙලින් උඩරට, පහතරට, සබරගමු ඇඳුම් කට්ටලවලට ආවේණික කොටස් ලෙස සැලකෙන්නේ,

a. ශිඛා බන්ධනය, අවුල් හැරය, කෙමෙත්ත
b. සිලුමිණ, පච්ච වඩම, මෝජුපත්‍ය
c. තෙල් කච්චිය, ජටාව, සිළුමිණ
d. තෙල් කච්චිය, හැඩතැල්ල, සිළුමිණය
e. ශිඛාබන්ධනය, කෙල් කච්චිය, සිළුමිණ

අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

11) පොළොන්නරු යුගයට අයත් ශිලා ලිපියක් නම් කරන්න. ?

12) සාම්ප්‍රදායික බෙරයක් සාදා ගැනීමේදී යොදා ගන්නා දිග ප්‍රමාණය කුමක්ද ?

13) ආගමික අවස්ථාවක් සඳහා යොදා ගන්න හේවිසි වාදනය හඳුන්වනනේ කුමන නමකින්ද ?

14) උඩරට නර්තන සම්ප්‍රදායේදී නර්තන ශිල්පියා හඳුන්වනනේ කුමන නමින්ද ?

15) සොකරි ඇතුලු පිරිස ගොඩබසින්නේ කුමන ප්‍රදේශයටදෙ ?

16) නිසරා, නාග ගජගා යන වන්නම් අයත් නර්තන සම්ප්‍රධාය කුමක්ද ?

17) කරන නාට්‍යම් හි කළ එළිය මංගල්‍යය හඳුන්වන්නේ කුමක් නමින්ද ?

18) කොහොඹා කංකාරියේ වට්ටම් නර්තනයට පෙර නටනු ලබන ශාස්ත්‍රිය නර්තනාංගය කුමක්ද ?

19) පත්තිනි හාමි යනුවෙන් හඳුන්වන්නේ කවුරුන්ද ?

20) සීගිනම් දේවාලය හා සම්බන්ද දෙවියන් නම් කරන්න.

21) දොළොල්මඩු යාගයේදී බිසෝ කප සිටුවීඹ යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ?

22) සමන් දේවාල පෙරහැරේ ඇති විශේෂිත අංගය කුමක්ද ?

23) සංගීතයේ වාද්‍ය නාදයනම් නර්තනයේ මාධ්‍යය කුමක්ද ?

24) ජන ජිවිතය සහ බැදි ගායනා අතර ගද්‍ය හා පද්‍ය කොටස් දක ගැනීමට හැකිවන්නේ කුමන ගායන විශේෂයකින්ද ?

25) " රටකට මව් සමිගින් ඒ නැව් නැග..... " මෙය කුමන කවියක්ද ?

26) දක්ෂිණ භාරතයට අයත් නර්තන සම්ප්‍රදායක් නම් කරන්න.

27) නට්ටුවානාර් යනු කවුරුන්ද ?

28) වල්ලතෝල් නාරායන් මෙගත් හමුවන්නේ කුමන භාරතීය සම්ප්‍රධායකද ?

29) ක්‍රිෂ්ණා හා රාධා යන චරිත හමුවනනේ කුමන භාරතීය සම්ප්‍රධායකද ?

30) දළදා පෙරහැරේ මුලින්ම නිල පංගු ක්‍රමයට අනුව ගමන් කරන නිලධාරියා කවුරුන්ද ?

හිස් තැනට සුදුසු පිළිතුරු සිත් ඉර මත ලියන්න.

31) මනසෙහි ඇතිවන මනෝභාවයන් උපාංගයන්ගෙන් ඉදිරිපත් කිරිම .............................................. අභිනය ලෙස හඳුන්වයි.

32) හින්දු බාලිකාවන් 500ක් නර්තනයේ යෙදුන ආකාරය .............................................. දේශාටන වාර්තාවේ සඳහන් වේ.

33) " අටදෙන අටදෙන වාඩි වෙයල්ලා " මෙය .............................................. කවියකි.

34) පොකුරු බෙරය පංචතුර්ය වර්ගීකරණය අනුව .............................................. ඝණයට අයත්වේ.

35) ප්‍රශස්ති කවි භාවිත කරමින් නර්තනයේ දෙනෙ නර්තනයක් ලෙස .............................................. නර්තනය හැදින්විය හැකිය.

36) කරදිය මුද්‍රා නාට්‍යයේ ප්‍රධාන චරිතය ලෙස .............................................. නර්තනය හඳුන්වා දිය හැකිය.

37) උඩරට, පහතරට, සබරගමු, නර්තන සම්ප්‍රධායන් තුනේම ගොඩ සරඹ, ඉලංගම් සරඹ .............................................. පද ත්‍රිවිධ ලය අනුව නර්තනය කරනු ලබයි.

1.12.2016 නර්තනය
13 ශ්‍රේණිය

38) ඉතාලිය, ප්‍රංශය, රුසියාව .............................. නර්තනයේ ආරම්භය හා විකාශනයට දායක වූ ප්‍රධාන රටවල් වේ .
39) සිංහල කුළු නර්තනයට සමාන ද්‍රවිඩ ජන නැටුම .............................................. නම් වේ.
40) කාවඩි නර්තනයේදී .............................................. දෙවියන් පුද ලබයි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

හිස්තැනට සුදුසු පිළිතුරු තිත් ඉරමත ලියන්න.

41) පනිභාරත මහතා නිර්මාණය කළ නර්තනාංග දෙකක් නම් කරන්න.
1. .............................................................. 2. ..............................................................

42) පහතරට සින්දු වන්නම් දෙකක් ලියන්න.
1. .............................................................. 2. ..............................................................

43) සේරපාන් නැමැති රාකෙනෙකු වටා පුරාවෘත්ත ගෙනී ඇති පහතරට සහ සබරගමු ශාන්තිකර්ම දෙක කවරේද ?
1. .............................................................. 2. ..............................................................

44) රස විග්‍රහ කරනු ලබන නාට්‍ය ශාස්ත්‍රය හා අභිනය දර්පන කාගේ කෘතීන්ද ?
1. .............................................................. 2. ..............................................................

45) බටහිර හංස විල නාට්‍යය කුමන රටේ නිර්මාණය වූවක්ද ? එහි රඟපෑ ප්‍රධාන නිළිය කවුරුන්ද ?
1. .............................................................. 2. ..............................................................

46) පහත රට දොළොස් පඩුවට අයත් නාට්‍යමය අවස්ථා දෙකක් නම් කරන්න.
1. .............................................................. 2. ..............................................................

47) දේශීය මුද්‍රා නාට්‍ය බිහි කිරීමේ පුරෝගාමිකයන් දෙදෙනෙකු නම් කරන්න.
1. .............................................................. 2. ..............................................................

48) දේශීය නර්තනයේදී අඩුම මාත්‍රා ගණන හා වැඩිම මාත්‍රා ගණන ලියා දක්වන්න.
1. .............................................................. 2. ..............................................................

49) වඩිග පටුන හා සුනියම් යක්ෂණිය රංගනයට කෙරෙන ශාන්ති කර්ම දෙක නම් කරන්න.
1. .............................................................. 2. ..............................................................

50) සම්ප්‍රදායන් තුනටම හා උඩරට සම්ප්‍රදායට අයත් අවශේෂ ශාන්ති කර්මයන් නම් කරන්න.
1. .............................................................. 2. ..............................................................

## II කොටස

I කොටස

01)
1 '' මංගලම් හි '' එක් කවියක් ප්‍රස්තාර කරන්න.
2 '' පන් තෙලිමේ '' කවියක් ප්‍රස්ථාර කරන්න.
3 '' කුදංත ගත දොංත '' වට්ටමේ තුන්වන අඩව්ව ප්‍රස්ථාර කරන්න.

02) පහතරට නර්තනයේ ඇති විවිදත්වය ශාන්ති කර්ම තුලින් මනාව පිළිඹිබු වේ.
1 විවිධත්වය දැකිය හැකි ශාන්ති කර්ම 3ක් හඳුන්වන්න.
2 එහි එක කවර හෝ රූපණ අවස්ථා 2ක් ගෙන ඉහත ප්‍රකාශන පැහැදිලි කරන්න.
3 ශාන්ති කර්මයන්හි භාවිත අභිනය ඇසුරු කොට ගෙව සාකච්ඡා කරන්න.

03) නර්තනයට මෙන්ම සන්නිවේදනය කාර්ය සඳහා ද භාවිතා වූ දේශීය වාද්‍ය භාණ්ඩ දේශීය සංගීත පද්ධතියක් ගොඩ ගැනීමේ දී ද උපකාරී වී ඇත.
1 සන්නිවේදන අවස්ථා මොනවාදැයි පෙන්වා දෙමින්. ඒ සඳහා යොදා ගෙන ඇති වාද්‍ය භාණ්ඩ මොනවාදැයි දක්වන්න
2 දේශීය සංගීතය දැහා භාවිතා කළ හැකි අවනද්ධ භාන්ඩ මොනවාදැයි හඳුන්වන්න.
3 ඒවා ස්වර වාද්‍ය භාණ්ඩ සමඟ වාදනය කිරීමේදී ඇතිවිය හැකි ගැටළු සහ ඒවාට විසඳුම් මොනවාදැයි සාකච්ඡා කරන්න. .

1 . 12 . 2016
නර්තනය .
2016

Learning Resource Centre
R
De Mazenod College
Kandana

II කොටස

04) මහනුවර යුගයේ නර්තන කලාවේ වූ සංවර්ධනය කෙරෙහි මතු දැක්වෙන කරුණු බලපා ඇති ආකාරය වෙන වෙනම ගෙන සාකච්ඡා කරන්න.
1 කොහොඹා කංකාරි ශාන්තිකර්මය
2 කවිකර මඩුව
3 දක්ෂිණ භාරතීය සංස්කෘතික ආභාසය

05) '' ගැමි නැටුම් ගැමි ජනතාවගේ සමස්ත ජීවන රටාව නිරූපණය කරන කලා මාධ්‍යයක් ලෙස සැලකිය හැකිය ''
1 ජීවන වෘත්තීන් හා විනෝදාස්වාදය සඳහා වූ ගැමි නැටුම් අංග 2ක් සාධක ලෙස ගෙන සාකච්ඡා කරන්න.
2 ආගමික විශ්වාස හා ඇදහිලි උදාහරණ ලෙස ගෙන ඉහත පාඨය සනාථ කරන්න.
3 සිරිත් විරිත් හා සමාජීය තොරතුරු ඇසුරින් කරුණු දක්වන්න.

III කොටස

06) 1. අභිනය යන්න හඳුන්වන්න.
2. සතර අභිනය නර්තනය හා බැඳෙන ආකාරය විස්තර කරන්න.

07) භරත නාට්‍යම් හා කථකලි නර්තන සම්ප්‍රදායන් පිළිබඳ පහත සඳහන් අංග ඔස්සේ සංසන්දනාත්මක විස්තරයක් කරන්න.
1 ආගමික පසුබිම හා නර්තව අංග
2 සංගීතය හා වාද්‍ය භාණ්ඩ
3 රංග වස්ත්‍රාභරණ හා අංග රචනය

IV කොටස

08) ඇද්‍යතන යුගයේ රූපවාහිනී නාලිකා ඔස්සේ හා ප්‍රසාංග වේදිකාවේ දක්නට ලැබෙන ඇතැම් නර්තන නිර්මාණ ශ්‍රී ලංකාවේ දේශිය නර්තනයේ සම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගැනීමට ඉවහල් වේ දැයි මතු දැක්වෙන අංග වලින වලට උදාහරණ දෙමින් පහදන්න.
1 නර්තන නිර්මාණ
2 රංග වස්ත්‍රාභරණ වල උචිතක්‍රමික බව
3 යොදා ගන්නා සංගීත හා ගීත

09) නර්තන කලාවේ ප්‍රභවයට හා විකාශනයට බලපෑ මූලික මානව අවශ්‍යතා පෙර අපරදිග රටවල් තුලින් උදාහරණ ගෙන පහත සඳහන් කරුණු ඔස්සේ සාකච්ඡා කරන්න.
1 ජීව විද්‍යාත්මක සාධක
2 සාමාජීය අවශ්‍යතා
3 ආගමික අවශ්‍යතා